ඉහළ යන "ආහාර ආනයන" වියදම

හැඳින්වීම

අනාදිමත් කාලයක් මෙරට පැවැති දේශීය ස්වයංපෝෂිත ආර්ථික රටාව බිඳ දැමූ යුරෝපීය යටත් විජිත වාදීන් ඒ වෙනුවට වාණිජ බෝග මත පදනම් වූ අපනයන ආර්ථික ක්‍රමයක් ශ්‍රී ලංකාවට හඳුන්වා දුන්හ. එබැවින් කෝපි, තේ, රබර් සහ පොල් ආදී විවිධ කෘෂිකාර්මික බෝග නිෂ්පාදනය පදනම් කරගත් මෙරට ආර්ථික ක්‍රමය පසු කාලීන විද්වතුන් හැඳින්වූයේ "සම්භව්‍ය අපනයන ආර්ථික" ක්‍රමයක් ලෙසටය. (Classical export Economy : Snodgrss : 1966) එමනිසා 1950 දශකයේ මෙතෙක් පැවති මෙම ආනයන/අපනයන ආර්ථික ක්‍රමය 1960 දශකයේ පමණ වන විට නැවත "දේශීය ස්වයංපෝෂිත ආර්ථික" ක්‍රමයක් කරා යොමුවන තත්ත්වයක් නිරූපනය කළද, එම තත්ත්වය පූර්ණ ආකාරයෙන්ම නොවීය. මෙරටේ වියලි කළාපීය ගොවිජනපද ව්‍යාපාර ආරම්භ කිරීම මගින් රට ආහාර නිෂ්පාදනයෙන් ස්වයං පෝෂිත කිරීම මෙම කාලවලදී රාජ්‍ය ප්‍රතිපත්තියේ මූලික ප්‍රමුඛත්වයක් ගත් ක්‍රියාමාර්ගයක් විය. 1960 දශකයේ ආරම්භ වූ හරිත විප්ලවයෙන් ද , 1970 දශකයේ ආරම්භ කරන ලද මහවැලි සංවර්ධන ව්‍යාපාර ද දේශීය වශයෙන් ආහාර නිෂ්පාදනය වර්ධනය කිරීමට, නිදහසින් පසු මෙරට ආරම්භ කළ දැවැන්තම සංවර්ධන යෝජනා ක්‍රමය විය. මේ අතර 1950 දශකයේ අවසාන කාලයේදී දේශීය වශයෙන් කර්මාන්ත සංවර්ධනයක් දියත් කිරීමද සමකාලීන රාජ්‍ය ප්‍රතිපත්තිවල ප්‍රමුඛතාවය හිමිවූ අංශයක් ලෙසට පෙන්වා දිය හැකිය.

අලෙවි හා ආහාර ප්‍රතිපත්ති අංශයේ ප්‍රධාන
ටී.ජ්. ධර්මරත්න විසිනි.

නව පසුබිම තුළ 1977 දී මෙරට ඇතිකරන ලද සුවිශේෂ සමාජ ආර්ථික ප්‍රතිපත්තිමය වෙනස්කම් හේතු කොටගෙන මෙරට දේශීය ආහාර නිෂ්පාදන ක්‍රියාවලිය තුළ විවිධ වෙනස්කම් රැසක් ඇතිවිය. විවෘත ආර්ථික ප්‍රතිපත්ති තුළින් ක්‍රියාත්මක කරන ලද පහත සඳහන් මූලික ක්‍රියාකාරී සංකල්පදෙක මෙරට ආහාර නිෂ්පාදන ක්‍රියාවලිය කෙරේ අසීමිත බලපෑමක් කර ඇත.

1. කිසිදු කාලීන ප්‍රමාණාත්මක හෝ ගුණාත්මක සීමාවකින් තොරව ප්‍රධාන ආහාරවර්ග(සහල්,අර්තාපල්,මිරිස්,ලුණු) ආනයනය කිරීමේ හැකියාව.
2. දේශීය ප්‍රධාන ආහාර ද්‍රව්‍යවල නිෂ්පාදන (පිරිවැය) මිලට වඩා අඩු පිරිවැයකට එම ආහාර ද්‍රව්‍ය ආනයනය කිරීමටහැකිවීම(සහල්, අර්තාපල්,මිරිස්,ලුණු

විවෘත ආර්ථික ක්‍රමය තුළ ඉතා පැහැදිලිව ක්‍රියාත්මක වන ඉහත සඳහන් ක්‍රියාකාරී සංකල්ප දෙක නිසා 1990 දශකයේ සිට ශ්‍රී ලංකාවට විශාල වශයෙන් "ආහාර ද්‍රව්‍ය ආනයනය" කිරීමේ උපනතියක් ජනිතවී ඇත. ඒ අනුව මෙම ලිපියේ මූලික අභිමතාර්ථය වනුයේ පසුගිය වසර කීපය තුළ මෙරට "ආහාර" ආනයනයේ ප්‍රමාණාත්මක සහ මූල්‍යම වටිනාකම්වල සිදුවී ඇති වර්ධනයන් පෙන්නුම්කර දීමත් එම ආහාර ආනයනය මගින් රජය බලාපොරොත්තු වූ "අඩු මිලට ආහාර සැපයීම" යන උපාය මාර්ගික සැලසුම් කෙතෙක් දුරට සපල වූයේද යන්නත් පිළිබඳ කෙටි පර්යේෂණයක යෙදීමය.

"ආහාර" ආනයනය සහ දේශීය කෘෂිකර්මය

නිදහස ලබාගත වූ අර්ධ සියවස තුළ ශ්‍රී ලංකා "කෘෂිකර්මයේ" මූලික "අභිමතාර්ථය" වූයේ දේශීය වශයෙන් "ආහාර ස්වයංපෝෂිතභාවය" ලබා ගැනීමය. නිදහස ලබා ගැනීමට පෙර සිටම මෙරට බලයටපත් වූ සෑම රජයක්ම සිය කෘෂිකාර්මික සංවර්ධන ප්‍රතිපත්ති මෙහෙයවූයේ ආහාර නිෂ්පාදනය වර්ධනය කරලීම උදෙසාය. 1930-40 දශකවල වියලි කලාපයේ පිහිටු වූ ගොවි ජනපද ව්‍යාපාරයන්ද 1960 හා 70 දශකවලදී ක්‍රියාත්මක වූ හරිත විප්ලවීය ක්‍රියාකාරිත්වයද, 1980 දශකයේ ක්‍රියාත්මක "මහවැලි සංවර්ධන" ව්‍යාපාරයන්ද, මෙරට ආහාර නිෂ්පාදනය වර්ධනය කිරීමෙහිලා නිදහසින් පසු ඇති කරන ලද සුවිශේෂිත උපාය මාර්ගික ක්‍රියාකාරිත්වයක් බව පෙන්වා දිය හැකිය. මේ අනුව මෙහි ප්‍රතිපලයක් ලෙසට 1980 දශකය වන විට ශ්‍රී ලංකාව ආහාර නිෂ්පාදනය අතින් ස්වයංපෝෂිත භාවය කරා ලඟාවූ බව බොහෝ විද්වතුන්ගේ අදහස වී ඇත. රාජ්‍ය ප්‍රතිපත්ති මගින් ලැබූ අනුග්‍රහය මේ සඳහා මූලික වශයෙන් දායක වූ අතර, ආහාර ආනයනය සීමා කිරීම සහ නවතාලීම, විදේශ විනිමය ඉතිරි කිරීමේ අරමුණු, දේශීය කෘෂි නිෂ්පාදන සඳහා මිල ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම, හා ඒ සඳහා අවශ්‍ය සහනාධාර හා අනෙකුත් පහසුකම් ලබා දීම වැනි කරුනු ද මූලික විය. මෙම තත්ත්වය හේතු කොටගෙන, සහල්, වියලි මිරිස්, ලූනු අර්තාපල්, වැනි මූලික ආහාර ද්‍රව්‍ය ආනයනය ඇතැම් වර්ෂවල සම්පූර්ණයෙන්ම අත්හිටුවා තිබුණු අතර, ඇතැම්

1990 දශකයේ මුල්භාගය, දේශීය ආහාර නිෂ්පාදක ක්‍රියාවලිය කඩාවැටීමේ ආරම්භය සනිටුහන් වී ඇත. 1977 දී මෙරටට හඳුන්වාදුන් "විවෘත ආර්ථික ප්‍රතිපත්ති පද්ධතිය මෙරට ආහාර නිෂ්පාදක ක්‍රියාවලිය අර්බුදයකටලක් කිරීමේ සමාරම්භය පියවර ලෙසට දැන් පිළිගැනීමට සිදුවී ඇත. විවෘත ආර්ථික ප්‍රතිපත්ති පද්ධතිය හඳුන්වාදුන් මුල් කාලයේදී පූර්ණ නිදහස් වෙළඳපල තත්ත්වයක් නොතිබුණ හෙයින් ඇතැම් ආහාර ද්‍රව්‍ය ආනයනය තුළ කිසියම් ප්‍රමාණාත්මක සීමාකම් දක්නට විය. මේ අනුව ආහාර ද්‍රව්‍ය ආනයන සීමාකිරීම් තුළින් දේශීය කෘෂි නිෂ්පාදන යන් සඳහා ඉහළ මිලක් ලබා දීමත් දේශීය කෘෂි නිෂ්පාදනයන් ආරක්ෂා කිරීමත්, කිසියම් ප්‍රමාණයකට සිදුවෙමින් පැවැතුණි. ඒ අනුව ප්‍රමාණාත්මක සීමා කිරීම් තුළින් ආහාර ආනයනය පාලන කිරීමත්, දේශීය කෘෂි නිෂ්පාදකයින් ආරක්ෂවන පරිදි එම සීමාකම් සහ පාලනයන් පවත්වාගෙන යෑමත් යන ද්විකාර්ය නිදහස් වෙළඳ ප්‍රතිපත්තිය මෙරට ගොවිපරපුර ආරක්ෂා කිරීම සඳහා යොදාගත් වෙස්වලාගත් ආශිර්වාදයක් විය. එසේ වුවද 1990 දශකයේ මුල්භාගය වන විට ශ්‍රී ලංකාව පූර්ණ විවෘත වෙළඳප්‍රතිපත්තිය අනුගමනය කිරීම සඳහා තැබූ ඉදිරි ප්‍රතිපත්තිමය වෙනස්කම් නිසා මෙම තත්ත්වය ඉතා කෙටිකාලීනව වෙනස්කර දැමීය. මෙම විවෘත වෙළඳ ප්‍රතිපත්තිමය වෙනස්කම්, දේශීය කෘෂිකර්මය කෙරේ ඉතා තදින් බලපෑම් කළ අතර එම ප්‍රතිපත්තිය වෙනස්කම් කීපයක් ඉතා සංක්ෂිප්ත ලෙස පහත සඳහන් පරිදි වර්ග කර පෙන්වා දිය හැකිය. මේ අනුව ප්‍රමාණාත්මක සීමා කිරීම් තුළින් ආහාර ආනයනය කිරීමත්, දේශීය කෘෂි නිෂ්පාදකයින් ආරක්ෂවන පරිදි එම සීමාකම් පවත්වාගෙන යෑමත් යන "ද්විකාර්ය නිදහස් වෙළඳ ප්‍රතිපත්තිය" මෙරට ගොවිපරපුර ආරක්ෂා කිරීම සඳහා යොදාගත් වෙස්වලාගත් ආශිර්වාදයක් විය. එසේ වුවද 1990 දශකයේ මුල් භාගය වන විට ශ්‍රී ලංකාව පූර්ණ නිදහස් විවෘත වෙළඳප්‍රතිපත්තියක් අනුගමනය කිරීම සඳහා තැබූ ඉදිරි ප්‍රතිපත්තිමය වෙනස්කම් නිසා මෙම තත්ත්වය ඉතා කෙටිකාලීනව වෙනස්කර දැමීය. මෙම විවෘත වෙළඳ ප්‍රතිපත්තිමය වෙනස්කම්, දේශීය කෘෂිකර්මය කෙරේ ඉතා තදින් බලපෑම් කළ අතර එම ප්‍රතිපත්තිය වෙනස්කම් කීපයක් ඉතා සංක්ෂිප්ත ලෙස පහත සඳහන් පරිදි වර්ග කර පෙන්වා දිය හැකිය.

මූලික වශයෙන් මෙම කරුණ වෙළඳ ප්‍රතිපත්තිමය වෙනස්වීම් හා ප්‍රතිසංස්කරණ යටතට ගැණෙන අතර එය මූලික කොටස් කිහිපයකට බෙදා වෙන්කළ හැකිය.

i. තීරු බදු සහ වෙනත් ක්‍රමයන් ප්‍රතිසංස්කරණයක්
ii. බදු වෙනත් ක්‍රමයන් පිළිබඳ වෙනස්කම්
iii. ප්‍රමාණාත්මක පාලනයන් පිළිබඳ ප්‍රතිසංස්කරණ
iv. ජාත්‍යන්තර වෙළඳ ගිවිසුම් සඳහා ශ්‍රී ලංකාව සහභාගී වීම
v. විනිමය අනුපාතික වෙනස්කම් (සැපයෙන විනිමය අනුපාතික ක්‍රමය)

මෙම වෙනස්කම් යටතේ හඳුන්වාදුන් ප්‍රධාන ප්‍රතිසංස්කරණ රාශියක් විය. විශේෂයෙන්ම කෘෂි නිෂ්පාදන හා අලෙවිය කෙරේ බලපෑම් කරනු ලද ප්‍රධාන ප්‍රතිසංස්කරණ සහිත වෙනස්කම්

රාශියක් 1977 සිට හඳුන්වා දෙනු ලැබිය.

මෙම ප්‍රධාන වෙනස්කම් අතර කැපී පෙනෙන 1994 දී ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් පිළිගන්නා ලද "ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ අංක viii දරණු ගිවිසුම" ප්‍රමුඛත්වයෙහිලා සැළකිය හැකිය. මෙම ගිවිසුම අනුව එළඹි ප්‍රධාන නිගමනය වූයේ කිසිදු ආකාරයක ප්‍රමාණාත්මක හෝ ගුණාත්මක පාලන සීමාවන්, ආනයන/ අපනයන වෙළඳාම සම්බන්ධයෙන් පැනවිය යුතු නොවේය යන්නයි. මෙම පූර්ණ නිදහස් වෙළඳපල තත්ත්වය ශ්‍රී ලංකාවට ලැබීමෙන් පසු ශ්‍රී ලංකාවේ යැපුම් දේශීය කෘෂි ආර්ථිකය තුළ ඇති වූ වෙනස්කම් අතිමහත්ය.

මෙම වෙනස්කම් විවිධ ආර්ථික ක්ෂේත්‍රයන් තුළ විවිධාකාර හා විෂමාකාර ලෙසට පැතිරී ගිය අතර මෙම ලිපියෙන් අවධානය යොමු කිරීමට උත්සාහ කරනුයේ මෙම පූර්ණ නිදහස් වෙළඳපල තත්ත්වය තුළ මෙරට "කෘෂිකාර්මික" ආහාර ද්‍රව්‍ය ආනයනය පිළිබඳව ඇතිවූ වෙනස්කම් සහ ඒ ආශ්‍රිත දේශීය නිෂ්පාදන වලට ඇතිවූ බලපෑම් පෙන්වා දීමත් ආහාර ආනයනය කිරීමෙන් බලාපොරොත්තු වූ අරමුණු කොතෙක් දුරට ඉටු වීද යන්නත් විග්‍රහ කිරීමය.

මෙම ආර්ථික ප්‍රතිසංස්කරන පද්ධතිය තුළ මෑතකාලීනව දැකිය හැකි එක් ප්‍රධාන උපනතිය වූයේ මෙරට ප්‍රධාන ආහාර වර්ග කීපයකම (සහල්,වියලිමිරිස්, අර්තාපල්, ලුණු) ආනයනය ප්‍රමාණාත්මක වශයෙන් ශීඝ්‍රයෙන් වර්ධනය වීමයි. එසේම මෙම ආහාර ආනයන සඳහා වැය වන විදේශ විනිමය වටිනාකමද ඉතාමත් ශීඝ්‍රයෙන් ඉහල ගොස් ඇත. ආනයන/අපනයන වෙළඳාම සඳහා කිසිදු ප්‍රමාණාත්මක හෝ ගුණාත්මක පාලන ක්‍රමයක් නොවන අතර අවශ්‍ය ඕනෑම ආහාර ද්‍රව්‍යයක් කිසිදු තහංචියකින් තොරව ආනයනය කළ හැකි තත්ත්වයක් ආර්ථික ක්‍රමය තුළ දැන් ඇති වී ඇති අතර ඒ සඳහා අවශ්‍ය වනුයේ නිසි මූල්‍ය ශක්තියක් පමණි. 1996 සිට 1998 ජූලි මාසය තෙක් ප්‍රධාන ආහාරද්‍රව්‍යවල ආයතනික තොග ප්‍රමාණයන් සහ එහි වටිනාකමත් එම ආහාර ද්‍රව්‍යය සඳහා කොළඹ වරාය තෙක් ලැබුණු සාමාන්‍ය මිලත් (cif price)පහත සඳහන් සංඛ්‍යා සටහන නිරූපනය කරනු ඇත.

ප්‍රධාන ආහාර ද්‍රව්‍යයල ආනයනික ප්‍රමාණය (මෙට්‍රික්ටොන්)

	1996	1997	1998 ජූලි මාසය තෙක්
සහල්	2,37609	2,99764	1,22081
වියලි මිරිස්	9,946	12,387	10,029
අර්තාපල්	26,913	1,11,900	69,076
ලොකු එණු	1,10665	1,20,643	74,603

ප්‍රධාන ආහාර ද්‍රව්‍යවල ආනයනකි වටිනාකම (රුපියල් දශලක්ෂ)

	1996	1997	1998 ජූලි මාසය තෙක්
සහල්	3753	4398	2002
වියලි මිරිස්	633	550	447
අර්තාපල්	426	1359	835
ලොකු එණු	1099	1348	1198

ආනයනික ප්‍රධාන ආහාර ද්‍රව්‍ය මිල රුපියල්/ කිලෝග්‍රෑම් 1 ක් සඳහා (CIF Price) කොළඹ වරාය තෙක්

	1996	1997	1998 ජූලි මාසය තෙක්
සහල්	17.21	17.71	16.40
වියලි මිරිස්	62.82	45.10	44.57
අර්තාපල්	18.07	12.15	12.09
ලොකුඑණු	12.21	11.17	16.07

මූලාශ්‍රය : අලෙවි හා ආහාර ප්‍රතිපත්ති අංශය
හෙ.කො.ගො.ප.පු. ආයතනය.

මෙම සංඛ්‍යාවලින් පැහැදිලිවන එක් ප්‍රධාන උපනතියක් නම් මෙම ආහාර ද්‍රව්‍ය ආනයන ප්‍රමාණයන් ඉතා ශීඝ්‍රයෙන් වාර්ෂිකව වර්ධනය වන බවයි. එසේම ඒ සඳහා වැය වන වාර්ෂික වටිනාකම ශීඝ්‍රයෙන් ඉහල ගොස් ඇති අතර දේශීය ආහාර වෙළඳපොලේ මූලික ආහාර ද්‍රව්‍ය අවශ්‍යතාවෙන් සහල් හැරුණු විටඅනෙකුත් ප්‍රධාන ආහාර ද්‍රව්‍යවලින් දල වශයෙන් සියයට 50කටත්

කි.ග්‍රෑ/රුපියල්		කොළඹ තොග වෙළඳපළේ ආනයනික ආහාර ද්‍රව්‍ය සඳහා වාර්ෂික තොග මිල	කොළඹ සිල්ලර වෙළඳපළේ ආනයනික ආහාර ද්‍රව්‍ය සඳහා සිල්ලර මිල	ආනයනික ආහාර ද්‍රව්‍ය සඳහා සාමාන්‍ය වාර්ෂික ආනයනික මිල (CIF Price) කොළඹ වරාය තෙක්
1996	සහල්	19.78	21.59	17.21
	වියලි මිරිස්	114.71	140.52	62.82
	අර්තාපල්	30.55	39.80	18.07
	ලොකුළුණු	21.70	30.80	12.21
1997	සහල්	20.02	22.07	17.71
	වියලි මිරිස්	71.54	96.86	45.10
	අර්තාපල්	20.67	28.14	17.15
	ලොතුළුණු	16.99	23.86	11.17
1998	සහල්	19.68	23.30	16.40
	වියලි මිරිස්	97.70	119.44	44.57
	අර්තාපල්	24.72	32.03	12.09
	ලොකුළුණු	30.04	38.88	16.07

වඩා වැඩි ප්‍රමාණයක් දැන් සම්පූර්ණ වනුයේ ආනයනික ආහාර ද්‍රව්‍ය වලිනි. මේ අතර ආයත කරනලද ආහාර ද්‍රව්‍යවල මිල හා එම ද්‍රව්‍යවල දේශීය වෙළඳපොලේ මිල ගණන් අතර පවතින වෙනස පහත සඳහන් සංඛ්‍යා සටහන් නිරූපනය කරනු ඇත.

	(කි.ග්‍රෑ/රුපියල්)	දේශීය ආහාර ද්‍රව්‍ය සඳහා වූ ගොවිපළ මිළ	දේශීය ආහාර ද්‍රව්‍ය සඳහා වූ කොළඹ තොගමිළ	දේශීය ආහාර ද්‍රව්‍ය සඳහා වූ කොළඹ සිල්ලර මිල	ආනයනික මිළ (CIF Price කොළඹ වරාය තෙක්
1996	සහල්	17.50	18.49	20.89	17.21
	වියලි මිරිස්	95.09	108.78	135.04	62.82
	අර්තාපල්	30.68	32.85	42.06	18.07
	ලොකුළුණු	17.57	21.95	28.94	12.21
1997	සහල්	18.44	19.55	22.05	17.71
	වියලි මිරිස්	62.00	67.14	91.74	45.10
	අර්තාපල්	25.01	27.48	36.53	12.15
	ලොකුළුණු	14.28	19.58	26.50	11.17
1998	සහල්	18.20	18.63	21.94	16.40
	වියලි මිරිස්	84.82	94.13	114.54	44.57
	අර්තාපල්	30.91	37.52	52.05	12.09
	ලොකුළුණු	-	30.14	39.30	16.07

(ජූලි මාසය තෙක් සාමාන්‍ය)

මෙම සංඛ්‍යා ලේඛණ මත පදනම් වී ඇති මූලික ආර්ථික ප්‍රතිපත්තිමය අදහස් කීපයකි. එනම්, දේශීයව මෙම ආහාර ද්‍රව්‍ය නිෂ්පාදනය කරනවාට වඩා අඩු මිලකට ආයාත කළ හැකි නිසා, දේශීයව මෙම ආහාර ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම ආර්ථිකමය වශයෙන් අලාභයක් සිදුවෙන කාර්යයක් ලෙසට තර්ක කළ හැකිවීමය.

මෙම කරුණ හා බැඳි අනෙක් අදහස වනුයේ දේශීය පාරිභෝගිකයාට දේශීය නිෂ්පාදන ලබාදෙන මිලට වඩා අඩු මිලට ආයත කරන ලද ආහාර ද්‍රව්‍යය ලබාදිය හැකි බවය.

එසේ වුවද මෙම කරුණ ආශ්‍රිතව පැන නැගී ඇති ප්‍රධාන ගැටළුව වී ඇත්තේ මෙම අඩු මිලකට ආයාත කරන ලද ආහාර ද්‍රව්‍ය එම මිල ගණන් යටතේ දේශීය පාරිභෝගිකයින්ට ලබා ගැනීමට

හැකියාවක් ඇතිවී තිබේද? යන්නය. දේශීය වෙළඳපලේ මිල ගණන් විමර්ශනය කිරීමේදී ආනයනික අඩු මිල ආහාර ද්‍රව්‍ය කිසිසේම එම මිල ගණන් යටතේ ශ්‍රී ලාංකික පාරිභෝගිකයාට ලබා ගැනීමට නොහැක වී ඇති අතර, එම මිල අඩුවීමේ ප්‍රතිලාභය දැනට ලබාගනුයේ මෙරට පාරිභෝගිකයන් නොව මෙරට ආනයනික වෙළපොළේ සිටින වෙළඳපල කොටස්කරුවන්ය. ආනයනික මිල හා මෙරටදී එම ආහාර ද්‍රව්‍ය සඳහා ලැබූ දේශීය වෙළඳ මිළ ගණන් අතර වෙනස ඉහත දක්වා ඇති මිල සටහන මැනවින් නිරූපනය කරනු ඇත. මේ අනුව අධික අලෙවිකරණ ආන්තිකයක් සහිතව මෙම ආනයනික ආහාර ද්‍රව්‍ය වෙළඳපළේ අලෙවි කරන හෙයින් එහි වාසිය වෙළඳුන් විසින් ලබා ගන්නා අතර මෙරට පාරිභෝගිකයාට එය නොලැබෙනු ඇත.

මේ අතර ආනයනික ආහාර ද්‍රව්‍යවල මිල ගණන් සහ දේශීය නිෂ්පාදිත එම ද්‍රව්‍යවල මිල අතර ඇත්තේද මෙම කරුණ හා සමාන උපනතියකි. දැනට ඉදිරිපත් වී ඇති අදහස වී ඇත්තේ දේශීයව නිෂ්පාදනය කරන ආහාර ද්‍රව්‍ය සඳහා ඉතා ඉහළ නිෂ්පාදන වියදමක් වැය වෙන හෙයින්, දේශීය පාරිභෝගිකයාට එම අධි මිල වැය කළ නොහැකි නිසා, අඩු පිරිවැයක් වැය වෙන විදේශීය නිෂ්පාදනය අඩු මිලක් යටතේ දේශීය පාරිභෝගිකයාට ලබාදිය හැකි බවයි. මේ නිසා පූර්ණ වශයෙන් ආහාර ද්‍රව්‍ය ආනයනය කිරීම යෝග්‍යය ප්‍රතිපත්තියක් වශයෙන් සාධාරණීයකරන කරන ඇතැම් වියතුන්, මෙම ආනයනික ආහාර ද්‍රව්‍ය සඳහා මෙරට පාරිභෝගිකයන් වෙළඳපොළේදී ගෙවනු ලබන මිල ගණන් විමර්ෂනය නොකරයි. පහත දැක්වෙනුයේ ආනයනික ආහාර ද්‍රව්‍යවලට මෙරටදී ලැබෙන සිල්ලර මිල සහ දේශීය නිෂ්පාදන වල සිල්ලර මිලත්, එම ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීමේදී මෙරට ගොවියන් ලබා ගන්නා ගොවිපල මිළ ගණනුත්ය.

මෙම තත්ත්වයේදී අවධාරණය කළ යුතු විශේෂ කරුණක් ඇත. එනම් ආනයනික ආහාර ද්‍රව්‍ය වෙළඳපලේ අලෙවි කරනුයේ මෙම ලිපියේ සඳහන් කොළඹ තෙක් පවතින මිල ගණන් (CIF Prices)වලට නොවේ. එහිදී දක්වා ඇත්තේ කොළඹ වාරයට ලැබෙන විට එම ද්‍රව්‍යවල කිලෝ 1ක ගැණුම් මිල පමණි. ඉන්පසු මෙම මිල ගණන් සඳහා ගුදම් ගාස්තු, ආනයන බදු, ආරක්ෂක බදු, ප්‍රවාහන පැටවුම්/බෑවුම් ආදී විවිධ වියදම් වර්ග මෙම මිල ගණන් වලට එකතු විය යුතුය. මේ අනුව ඇතැම් අවස්ථාවලදී "ආනයනික ආහාර ද්‍රව්‍ය මිල ගනන් අඩුය". යන කල්පිතය බිඳ වැටීමට ඉඩ ඇත.

එසේ වුවද පසු ගිය වසර 2-3 කාලීන අත්දැකීම් මත පෙනී යන්නේ මෙම බාහිරව එකතුවන අගයන් ඉතා විශාල නොවන බවයි. එම අගයන් ඉතා විශාල නොවන බවයි. එම අගයන් එකතුවීමෙන් ඉතා විශාල ලෙස ආහාර ද්‍රව්‍ය වල මිල ඉහල යා නොහෙති අතර, දේශීය නිෂ්පාදන සඳහා වැය වෙන පිරිවැය ඉක්මවා යාමටත් හෝ දේශීය නිෂ්පාදිත ආහාර වර්ගවල මිල ගණන් හා සමාන වීමට එය ප්‍රමාණවත් නොවනු ඇත. එබැවින් ආනයනික ආහාර ද්‍රව්‍යවල මිල ගණන්, අනිවාර්යයෙන්ම දේශීය නිෂ්පාදකයන්ගේ මිල ගණන්වලට පහලින් පිහිටිය යුතුය. නමුත් එය එසේ නොවන්නේ "වෙළඳපල ක්‍රියාකාරිත්වයේ ඇති කිසියම් දෝෂසහගත බවක් නිසා යයි විශ්වාස කළ හැකිය.

ප්‍රධාන ආහාර ද්‍රව්‍ය ආනයනය කිරීමෙන්ම, අඩු මිලකට පාරිභෝගික ජනතාවට ආහාර ලබාදිය හැකිය යන උපකල්පනය පිළිබඳ මනා අත්දැකීමක් පසු ගිය වසරේ සහල් ආනයනය තුළින් පෙන්වා දිය හැකිය. 1997 වර්ෂයේ අපනයනය මෙරට සහල් මිල ගණන් ඉතාමත් ඉහල අගයක් වාර්තා කළ අතර උපරිම මිල වූයේ රුපියල් 33.50 ක් සම්බා පලමු වැනි ශ්‍රේණිය සඳහාය. ඉහල යන සහල් මිල ගණන් අඩු කිරීම සඳහා රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදකයින් විසින් කරනු ලැබූයේ සහල් ආනයනය සඳහා පවතින සියයට 35 ආනයනය බදු සීමාවන් අවලංගු කොට 1997 නොවැම්බර් මස සිට 1998 ජනවාරි 31 දින දක්වා අපනයන බදු සීමාවන් ඉවත් කොට සහල් ආනයනය කිරීමට සුදුසු නිදහස් වෙළඳපළ ප්‍රතිපත්තියක් ඇතිකිරීමය. මේ නිසා රටතුලට සහල් විශාල තොග ලැබුණද එම සහල් ඉතාමත් අඩු මිලකට ආනයනය කළද, රටතුල දේශීය වෙළඳපලේ ආනයන සහල් විල හෝ දේශීය සහල් මිල ගණන්වල සැලකියයුතු අඩුවීමක් සිදු නොවූ බව මෙහි දක්වා ඇති ප්‍රස්ථාර සටහනින් මනාව පැහැදිලි වේ. එසේ වුවද, ආනයනික සහල් නිසා දේශීය වෙළඳපලේ ඇති මිල ඉහල යාමේ උපනතිය අඩු කිරීම මෙහිලා සැළකිය යුතු වැදගත් කාරණයකි. සහල් මිල ගණන් අඩු වීමත් ඇත්ත වශයෙන්ම වාර්තා වන්නේ 1998 ජනවාරි සිට වන අතර එයට මූලික හේතුව වූයේ සහල් ආනයනය නොව 1997/98 මහ කන්නයේ වී නිෂ්පාදනයේ වෙළඳපලට පැමිණිය විශේෂයෙන්ම බදු සහන ලැබූ 1997 නොවැම්බර් දෙසැම්බර් මාස වල විශාල වශයෙන් සහල් ආනයනය කළද මිල අඩු වීමක් සිදු නොවී ඇති මෙම සංඛ්‍යාන හා ප්‍රස්ථාර සටහන් නිරූපනය කර ඇත.